# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,994 - 2016 නොවැම්බර් මස 18 වැනි සිකුරාදා - 2016.11.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — | වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — | පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — | පිස්කල් විකිණීම ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — | මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — | නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — | නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| | | විවිධ දැන්වීම් ... ... ... ... | 1372 |


*සැ. යු.* - (i) ලසාලියන් සමාජයීය අධ්‍යාපන සේවාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2016 ජූලි මස 08 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) ආලෝකා සමාජ සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2016 අගෝස්තු මස 26 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) ජයමග සංවර්ධන, සමාජ සත්කාරක හා පුණ්‍යාධාර පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2016 සැප්තැම්බර් මස 30 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2016 දෙසැම්බර් 09 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 නොවැම්බර් මස 25 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2016 සැප්තැම්බර් මස 15 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# විවිධ දැන්වීම්

**සිය සිවිල් අධිකරණ බලය කොළඹ දී ක්‍රියාත්මක කරනු ලබන බස්නාහිර පළාතේ මහාධිකරණයේ දී ය**

කොළඹ 02, නවම් මාවතේ, අංක 46/46 දරන ස්ථානයේ ග්‍රීන් ලංකා ටවර් හි ග්‍රීන් ලංකා ෂිපිං ලිමිටඩ් යන කාරණය සම්බන්ධයෙනි.

*සහ*

*නඩු අංකය* : HC (Civil) 49/16/CO
*ස්වභාවය* : ඈවර කිරීම
*කාර්යපටිපාටිය* :
*වටිනාකම* : රු.

ග්‍රීන් ලංකා ෂිපිං ලිමිටඩ් අධිකරණය මගින් ඈවර කිරීම පිණිස 2007 අංක 07 දරන සමාගම් පනතේ 534 වගන්තිය සමග කියවිය යුතු 270 (e) වගන්තිය යටතේ කරනු ලබන අයදුම්පතක් පිළිබඳ කාරණය සම්බන්ධයෙනි.

චීන ජනරජයේ, තායිවාන්, තායිපේ, 104, මින්ග්ෂෙන්ග් ඊස්ට් පාරේ, අංක 166 sec 2 දරන ස්ථානයේ එවර්ග්‍රීන් මැරායන් කෝර්පරේෂන් (තායිවාන්) ලිමිටඩ්.

..................................................*පෙත්සම්කරු.*

කොළඹ දී පවත්වනු ලබන (සිය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන) බස්නාහිර පළාත් මහාධිකරණය විසින් ඉහත නම් සඳහන් සමාගම ඈවර කිරීම පිණිස පෙත්සමක්, 2016 ක් වූ සැප්තැම්බර් මස 21 වැනි දින එකී අධිකරණය වෙත පෙත්සම්කරු වෙනුවෙන් ඩී. එල්. සහ එෆ් ද සේරම් මහතුන් විසින් ඉදිරිපත් කර ඇති බව ද, එකී පෙත්සම 2016 ක් වූ නොවැම්බර් මස 23 වැනි දින අධිකරණය ඉදිරියෙහි විභාග කරනු ලැබීමට නියම කර ඇති බව ද, එකී පෙත්සම මත නියෝගයක් කිරීම තහවුරු කිරීමට හෝ ඊට විරුද්ධ වීමට හෝ කැමති, එකී සමාගමේ කිසියම් ණයහිමියකු හෝ සහදායකයකු වේ නම් ඒ තැනැත්තාට තත් කාර්ය සඳහා එය විභාග කරන අවස්ථාවෙහි පෞද්ගලිකව හෝ තමාගේ නීතිඥවරයා මාර්ගයෙන් හෝ පෙනී සිටිය හැකි බව ද, පෙත්සමේ පිටපතක් අවශ්‍ය වන එකී සමාගමේ ඕනෑම ණය හිමියකුට හෝ සහදායකයෙකුට ඒ සඳහා නියමිත ගාස්තුව ගෙවූ විට පහත සඳහන් අය විසින් සපයනු ලබන බව ද, මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩී. එල්. සහ එෆ් ද සේරම් මහත්වරු,
අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස,
කොළඹ 07.

*සටහන.*- එකී පෙත්සම විභාග කෙරෙන අවස්ථාවෙහි පෙනී සිටීමට කැමති ඕනෑම තැනැත්තෙකු විසින් තමා එසේ කිරීමට අදහස් කරන බවට ලිඛිත දැන්වීමක් ඩී. එල්. සහ එෆ් ද සේරම් මහතුන් වෙත භාරදිය යුතු ය. නැතහොත් තැපෑලෙන් එවිය යුතු ය. එම දැන්වීමෙහි එම තැනැත්තාගේ නම සහ ලිපිනය ද, ව්‍යාපාර ආයතනයක් නම් ව්‍යාපාර ආයතනයේ නම සහ ලිපිනය ද සඳහන් කළ යුතු අතර, එය එම තැනැත්තා හෝ ව්‍යාපාර ආයතනය විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ (නීතිඥවරයෙකු වෙතොත්) එම නීතිඥවරයා විසින් අත්සන් කල යුතුවාක් මෙන්ම 2016 ක් වූ නොවැම්බර් මස 22 වැනි දින සවස 6.00 ට පෙර ලැබෙන ලෙස භාරදිය යුතු ය. නැතහොත් තැපෑලෙන් එවන්නේ නම් එදින එකී වේලාවට පෙර ලැබෙන ලෙස කල්වේලා ඇතිව තැපැල් කළ යුතු ය.

11-771

---

**පොලොන්නරුව බෞද්ධ සංගමය සංස්ථාගත කිරීම් සඳහා වූ පනතකි**

මලිත් ජයතිලක වන මා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 48 (1) දරන ස්ථාවර නියෝගය යටතේ ''පොලොන්නරුව බෞද්ධ සංගමය නීතිගත කිරීම සඳහා වූ පනතකි'', යනුවෙන් අංක 1977 දරන හා 2016.07.22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද දැන්වීම මෙ මගින් පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

''පොලොන්නරුව බෞද්ධ සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි''

මලිත් ජයතිලක,
පාර්ලිමේන්තු මන්ත්‍රී.

11-767

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.